# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

## ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 01 සේවා ගණයේ (MN 06 – 2006 A) මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

**1.0.** සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරී ඛණ්ඩ - 01 සේවා ගණයේ (MN 06 – 2006 A) ට අයත් මනෝ විද්‍යාඥ II ශ්‍රේණියේ තනතුරු 07 ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමුකිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

**3.0.** පවත්නා පුරප්පාඩු මත පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

**4.0. භාෂා මාධ්‍ය :**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**5.0.** මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය :

**5.1 මූලික සුදුසුකම් :**

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

III. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වන විට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**5.2 අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමග මනෝ විද්‍යාව සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සම්මාන සමාර්ථයක් ලබා තිබීම.

**5.3 වෘත්තීය සුදුසුකම් :**

රජය පිළිගත් වෛද්‍ය ආයතනයක සායනික මනෝ විද්‍යාව පිළිබඳ ( Clinical Psychology) වසර 02ක පුහුණුවක් ලබා තිබීම;

*සහ*

මනෝ වෛද්‍ය විශේෂඥවරයෙකුගේ අධීක්ෂණය යටතේ මාස (06) ක පුහුණුවක් ලබා තිබීම.

**5.4 කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**6.0. වයස් සීමාව :**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

**7.0. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.62, 230 – 10 x 1,190 – 11 x 1,360 x 15 x 1,670 – රු. 114,140

**8.0. ලිඛිත පරීක්ෂණය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශ | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01.බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යාව හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. | පැය 1 1/2 | 100 | 40% |
| 02.විෂයානුබද්ධ දැනුම | මානසික සෞඛ්‍ය හා මනෝ විද්‍යාත්මක ප්‍රතිකාර ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. | පැය 03 | 100 | 40% |

**9.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

IV. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-06 -2006 ඒ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධානවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

**10.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් **A4** ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 වන පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළඟ පිටුවලටද වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

II. තනතුරට බඳවා ගැනීමේදී සලකා බලන අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික පත්‍ර අයදුම්කරු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර අයදුම්පත්‍රය සමඟ යොමු කිරීම අනිවාර්ය වේ.

III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2026.09.11** වේ. අයදුම්පත් **2026.09.11** වැනි දිනට හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ (පාලන) 07, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **"මනෝ විද්‍යාඥ තනතුරට බඳවා ගැනීම (විවෘත) සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතු යි.

V. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපෑල මඟින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

VI. විභාග ගාස්තුව රු.1000.00/= කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. **ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ " සෞඛ්‍ය ලේකම් " නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට** බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. ( මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

VII. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්වයකාරවරයකු / දිවුරුම් කොමසාරිස්වරයකු / නීතිඥවරයකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදා අධිකාරීලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 854,880/= කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

VIII. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

IX. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

**11.0.අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**12.0.සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත් සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

**2026 අගෝස්තු මස 02 දින,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,**
**කොළඹ 10.**